සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
**General Certificate of Education (Adv. Level) Examination, August 2012**

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

සිංහල II
சிங்களம் II
Sinhala II

**71 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

විභාග අංකය : ...............................

උපදෙස්:

* I කොටසේ 1 ප්‍රශ්නය ද, II කොටසේ 2, 3 ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* 1 ප්‍රශ්නයේ ඇති සියලු ම අනුකොටස්වලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
* I කොටස, II කොටසේ පිළිතුරු පත් සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

1. එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරාගෙන **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1. **අනුනාසික** අක්ෂර පේ සැලකෙන්නේ කවරක් ද?
(1) ඟ, ජ, ඩ, ඳ, ඹ (2) ය, ශ, ෂ, ස, හ (3) ප, ඵ, බ, භ, ම
(4) ඞ, ඤ, ණ, න, ම (5) ත, ථ, ද, ධ, න (.........)

1.2. **නිවැරදි අක්ෂර වින්‍යාසය** සහිත පද පේළිය තෝරන්න.
(1) කණිෂ්ඨ, ප්‍රථිඵල, සීඝ්‍ර, වර්ධනය (2) පුස්ථකාලය, සම්ප්‍රදන, මර්දනය, අභිලාෂ
(3) වීරෝධාර, පරමාර්ථ, දෘෂ්ඨි, ශිෂ්ටාචාරය (4) ලේඛන, ඖෂධ, අෂ්ඨ, ග්‍රහනය
(5) කොට්ඨාසය, ප්‍රදර්ශන, ප්‍රස්තාර, විශිෂ්ට (.........)

1.3. **අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති** පද පේළිය තෝරන්න.
(1) කඩුවෙල, කොට්ටාව, කෝට්ටේ, කොටුව (2) ආටිගල, ඇඹුල්ගම, ඉංගිරිය, කොළොන්නාව
(3) කොළඹ, දඹුල්ල, මාතලේ, අනුරාධපුර (4) කැලණිය, ගම්පහ, ජාඇල, කඳාන
(5) මාතර, හම්බන්තොට, පුත්තලම, මීගමුව (.........)

1.4. පහත සඳහන් වරණ අතුරෙන් **නිවැරදි ප්‍රකාශය** තෝරන්න.
(1) කොම්බුව සහ ගයනුකිත්ත යෙදෙනුයේ ස්වරයකට මුලින් පමණි.
(2) කොම්බුව සහ ගයනුකිත්ත 'ඖ' කාරය නියෝජනය සඳහා ව්‍යඤ්ජනයකට පමණක් යෙදේ.
(3) කොම්බුව සහ ගයනුකිත්ත ස්වරයකින් හා ව්‍යඤ්ජනයකින් තොරව ද යෙදිය හැකි ය.
(4) ගයනුකිත්ත සමඟ කොම්බු දෙකක් ද යෙදිය හැකි ය.
(5) කොම්බුව ගයනුකිත්ත හැමවිට ම එක්ව යෙදිය යුතු ය. (.........)

1.5. **රකාරාංශය, ගයනුකිත්ත, රේඵය** හා **යංශය** සහිත වචන **අනුපිළිවෙළින්** යෙදී ඇති පේළිය තෝරන්න.
(1) ප්‍රශ්නය, ඓක්‍යය, සංවර්ධනය, කෞතුක (2) ආමන්ත්‍රණය, වෛද්‍ය, ඓතිහාසික, වර්ග
(3) ආක්‍රමණය, නෞකාව, මාර්ගීය, අද්‍යතන (4) ආයුර්වේදය, අනිත්‍ය, මෞලික, පරාක්‍රම
(5) ප්‍රාරම්භ, පෞරුෂය, මද්‍යපාන, වණිතා (.........)

1.6. එකිනෙකට **අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති** වරණය තෝරන්න.
(1) විහාර මන්දිරය, භාරත දේශය, රාජ සභාව, ඇමති මණ්ඩලය
(2) ඡන්දස් ශාස්ත්‍රය, අලංකාර වාදය, ස්වභාව දහම, වෛද්‍ය මධ්‍යස්ථානය
(3) හිරු මඬල, විදුලි ආලෝකය, සුබ මංගලම්, කිරිය විධි
(4) ස්තූප වංශය, මූල්‍ය ප්‍රතිපාදන, ආරක්ෂක අමාත්‍ය, සෞඛ්‍ය මධ්‍යස්ථානය
(5) ශීල ව්‍යාපාරය, යෝජනා ක්‍රමය, ලංකා ද්වීපය, බඹ ලෝකය (.........)

1.7. **තත්සම වචන පමණක්** අන්තර්ගත වරණය කුමක් ද?
(1) වෛශාඛ, ප්‍රෞඪ, ගවේෂණ, කෞශල්‍ය (2) ඉෂ්ට, පස්වග, වර්ෂා, නිරූපණ
(3) ප්‍රදර්ශන, මාලිගා, ගැටලු, සෘතු (4) වක්‍රෝක්ති, අබිනය, නාට්‍ය, අලංකාර
(5) පුරහල, පිළියෙල, වලාකුළ, පොකුණ (.........)

1.8. මුලින් දක්වෙන පදයට **විරුද්ධාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.
(1) නිශ්චිත - අවිනිශ්චිත, සැකය, සංකා, සන්දේහ (2) ජ්‍යෙෂ්ඨ - කනිෂ්ඨ, බාල, ළදරු, කනිටු
(3) ප්‍රබුද්ධ - අප්‍රබුද්ධ, අල්පශ්‍රැත, අඥාන, මෝඩ (4) තරුණ- වෘද්ධ, මහලු, යෞවන, වැඩිහිටි
(5) ශීලාචාර - අශීලාචාර, අධර්මිෂ්ඨ, නොදමුණු, අශිෂ්ට (.........)

1.9. මුලින් දී ඇති පදයට **සමානාර්ථ පදයක්** ඇතුළත් **නො වන** වරණය තෝරන්න.
(1) දිය - ලෝකය, වතුර, ජය, දුනුදිය (2) කලාප - මිටිය, සමූහය, පොකුර, ගොනුව
(3) නද - නාදය, සෝෂාව, හඬ, අසතුට (4) යතුරු - යන්ත්‍රය, ගමන, යතුර, යාම
(5) ඉසුරු - ඊශ්වර, නායක, ඓශ්වර්ය, සම්පත්තිය (.........)

[ දෙවෙනි පිටුව බලන්න.

1.10. **අව්‍යය, අන්‍යාර්ථ, විශේෂණ, ද්‍වන්ද්‍ව** යන සමාසවලට අයත් පද **පිළිවෙළින්** දක්වා ඇති පේළිය තෝරන්න.
(1) අකුසල්, දසබල, පන්සිල්, ගීනැටුම්
(2) පසැස්, කුපුරිස්, ගේදොර, අටසිල්
(3) සුදුමල්, ගුරුපඬුරු, අනුබල, ගස්වැල්
(4) අසුර, කිරිබත්, දෙලෝ, පොත්පත්
(5) සුවඳ, තිනෙත්, උපවන, මස්මාළු
(.........)

1.11. **කෘදන්ත පදයක් අන්තර්ගත නො වන** වරණය තෝරන්න.
(1) මළ, කළ, වපුළ, ඇවිළ
(2) හමන, ගයන, වයන, පවන
(3) කෙටු, වැටු, බැලූ, ලියූ
(4) කරනු, වළඳනු, යනු, බලනු
(5) නැටිලි, කැපිලි, වැටිලි, රැකිලි
(.........)

1.12. පහත සඳහන් වැකිවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද **අයත් ක්‍රියා වර්ගය** පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
❋ ගොවියා දරුවා ලවා හරක් **බඳවයි.**
❋ මම ද බුදු **වෙම්වා** ලොවුතුරා.
❋ මව **සොයා** දරුවා හඬයි.
❋ ඔහු බසයෙන් **බසිද්දී** වැටුණේ ය.
(1) ආශිර්වාදක්‍රියා, පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, ප්‍රයෝජ්‍යක්‍රියා
(2) ප්‍රයෝජ්‍යක්‍රියා, ආශිර්වාදක්‍රියා, පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා
(3) පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, ප්‍රයෝජ්‍යක්‍රියා, ආශිර්වාදක්‍රියා
(4) ප්‍රයෝජ්‍යක්‍රියා, පූර්වක්‍රියා, ආශිර්වාදක්‍රියා, අසම්භාව්‍යක්‍රියා
(5) අසම්භාව්‍යක්‍රියා, ප්‍රයෝජ්‍යක්‍රියා, පූර්වක්‍රියා, ආශිර්වාදක්‍රියා
(.........)

1.13. **අනුක්ත පද දෙකක් හා උක්ත පද දෙකක්** ඇති පේළිය තෝරන්න.
(1) සොරුන්, ළමයෙක්, අපි, මීයෙක්
(2) ඇතකු, සිංහයෙක්, කුකුළෙක්, හාවෙක්
(3) අහනක්, ගොවියකු, ලතාවෝ, දෙවියෙක්
(4) ගවයෙක්, ගැහැනියක, හිමියන්, යකෙක්
(5) දරුවන්, ඉත්තෑවෙක්, ඌරෙක්, මැණියෝ
(.........)

1.14. **උපසර්ගයක් යෙදී නැති** පදයක් සහිත පද පේළිය අයත් වරණය තෝරන්න.
(1) සුදන, දුදන, විමල, නිර්මල
(2) අවමානය, නිරහංකාර, ප්‍රබල, උපකාර
(3) අස්ථිර, අබල, අඳුර, අපල
(4) අනුමාන, ආගමන, අසරණ, අපවාද
(5) සාතිශය, විශිෂ්ට, අපවාද, සුසිල්වත්
(.........)

1.15. '**සිඟිති** දරුවන් **උදෙසා** ලියැවුණු **පොත්පත්** දින් දින බහුලව දක්නට ඇත.'
යන්නෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරෙන් ඇති පද** අයත් වන්නේ මෙයින් කුමන ව්‍යාකරණ අංගවලට ද?
(1) සමාස, නිපාත හා තද්ධිත පදවලට ය.
(2) නිපාත, සමාස හා තද්ධිත පදවලට ය.
(3) සමාස, තද්ධිත හා නිපාත පදවලට ය.
(4) තද්ධිත, සමාස හා නිපාත පදවලට ය.
(5) තද්ධිත, නිපාත හා සමාස පදවලට ය.
(.........)

1.16. ව්‍යාකරණානුකූල ව **නොගැළපෙන** පදයක් ඇති වරණය කුමක් ද?
(1) වදළ, වගුළ, මතුළ, හදළ
(2) ගයමින්, නටමින්, දුවමින්, හඬමින්
(3) කඩිති, දියති, පැතිති, කැදිති
(4) පෞරුෂ, යෞවන, උරුමය, අයෝමය
(5) තිලුපුල්, රතඳර, අතැගිලි, මුලසුන
(.........)

1.17. **සමාස පදයක් ඇතුළත් නො වන** වරණය තෝරන්න.
(1) අනුබල, අනලස්, දුගඳ, අනදර
(2) කිරිබත්, පින්හාල්, සොරබිය, බුදුගුණ
(3) සුදුමල, තිලුපුල්, පාතඹර, දසසිල්
(4) මවුපිය, හිරසඳ, සුරනර, චතුපිටි
(5) කුපුරිස්, යාවජීව, කුමුදු, කුදිටු
(.........)

1.18. **එක ම වර්ගයට අයත් සන්ධි පද** අන්තර්ගත වරණය තෝරන්න.
(1) සුරතැඟිලි, රතුපුල්, කන්‍යාරාමය, ගුණැති
(2) නුවනුපුල, සහසැස්, නරේන්ද්‍ර, පූජාසන
(3) පංචේන්ද්‍රිය, නරේන්ද්‍ර, මහාතිශංස, සද්දරණීය
(4) රතත, පිනැති, පසිඳුරන්, නරනිඳු
(5) දකුණත, වමත, ගංවතුර, බහ්වර්ථ
(.........)

1.19. ව්‍යාකරණානුකූල ව **නිවැරදි වාක්‍යය** තෝරන්න.
(1) ඔවුහු කන්ද බසිද්දී ඇතෙක් ඉදිරියට ආවේ ය.
(2) ඇතැම් සම්ප්‍රදායන් වෙනස් වී ඇත.
(3) විදගම හිමියන් ලෝවැඩ සඟරාව රචනා කළහ.
(4) ගංගාවන් මුහුදට ගලති.
(5) මිනිසුන් ධාර්මික වෙත්වා.
(.........)

1.20. **වඩාත් ම නිවැරදි පද බෙදීම** සහිත වාක්‍යය තෝරන්න.
(1) නවකථාවේආරම්භයපිළිබඳව මහාචාර්ය සරච්චන්ද්‍ර දරන අදහස මාර්ටින්වික්‍රමසිංහසම්පූර්ණයෙන් නොපිළිගනී.
(2) පැරණිකාව්‍යයේ ආකෘතියපමණක්නොව වස්තු විෂයද ඒකාකාරී විය.
(3) මධ්‍ය යුගයට අයත් සිංහල කාව්‍ය සාහිත්‍යය කාව්‍ය ග්‍රන්ථ තුනකින් යුක්ත වේ.
(4) ලංකාව වැනි ධර්මද්වීපයක බුද්ධෝත්පාද කාලයකකතුවරයාට ඉපදෙන්ට ලැබීමගැන බෙහෙවින් සතුටුවෙයි.
(5) සාහිත්‍යකෘතියක කාර්ත්‍යසොයාගත හැක්කේහොඳ සංස්කරණයන්ගේ ආධාරයෙනි.
(.........)

(ලකුණු 20 යි)



agaram.lk
83471

**3.** දී ඇති මාතෘකාවලින් එකකට අදාළ ව වචන **300 - 350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) පුරාවස්තු මංකොල්ලය නිසා වැනසෙන ශ්‍රී ලංකාවේ ජාතික උරුමය

(ii) තරුණ පරපුරේ ආකල්ප හා චර්යා කෙරෙහි නූතන ටෙලි නාට්‍ය ඇතිකරන බලපෑම

(iii) ලක්දිව උසස් අධ්‍යාපනය සඳහා ඉංග්‍රීසි භාෂා මාධ්‍යය යොදා ගැනීමේ අවශ්‍යතාව

(iv) පශ්චාද් යුද්ධ සමයේ දී ශ්‍රී ලංකාව මුහුණ පාන දේශපාලනමය ගැටලු

(v) රටක සංවර්ධන ක්‍රියා දාමයේදී ආධ්‍යාත්මික සංවර්ධනයට ලැබිය යුතු තැන

(vi) ප්‍රකාශන නිදහස සහ ශ්‍රී ලංකාවේ මුද්‍රිත ජනමාධ්‍යවල ක්‍රියාකාරිත්වය

(ලකුණු 25 යි)

**4.** (අ) පහත සඳහන් වාක්‍යවල **සඳෙස් තැන් ඇතොත් නිදෙස් කොට** ලියන්න.

(i) රටේ අනාගත පුරවැසියෝ අප නොවෙමු ද?

(ii) ලේඛකයකු වූ කේ. ජයතිලක මහතා සාහිත්‍ය විචාරකයෙක් ද විය.

(iii) තරගයෙන් ඉවත් වූයේ පාපැදිකරුවන් කිහිපදෙනෙක් බව සංවිධායකයෝ පැවසූහ.

(iv) ඇමතිවරයෙක් රැස්වීම අමතද්දී රැස්ව සිටි පිරිස අත්පොළසන් දුන්හ.

(v) ඇතැම් සංස්කෘතීහු වෙනස් වී ඇත.

(ලකුණු 05 යි)

(ආ) පහත සඳහන් වාක්‍ය **කර්මකාරකයට** හරවන්න.

(i) සාමාජිකයෝ යෝජනා ඉදිරිපත් කරති.

(ii) මුරකරුවෝ සොරුන් පලවා හරිති.

(iii) ඉපැරණි රජදරුවෝ වැව් තැනවීම සඳහා ගංගාවන් හරස් කළහ.

(iv) ඇමතිතුමා අප පසසයි.

(v) සභාපතිතුමා සාහිත්‍යධරයන් අනුමණ්ඩලයට පත් කරයි.

(ලකුණු 05 යි)

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා **සුදුසු** පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(i) හෙට (ඔවුහු/ඔවුන්) එති'යි අපි නොසිතමු.

(ii) (දරුවෝ/දරුවන්) අවංක විය යුතු ය.

(iii) ඇදුරුතුමා සිසුන්ට සිප් සතර (දෙයි/දෙති)

(iv) තුරු පෙළ සුළඟට (සෙලවෙති/සෙලවෙයි)

(v) වෙදදුරා (සිසුහු/සිසුන්) ලවා ලෙඩුන් බලවයි.

(ලකුණු 05 යි)

agaram.lk

**5.** (අ) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** දක්වා ඇති පදවල **අර්ථ විග්‍රහ කර** ලියන්න.

(i) අපි ඒ **මනස්කාන්ත** දර්ශනයෙන් වසඟ වීමු.

(ii) මහා පරාක්‍රමබාහු රජතුමා **අනභිභවනීය** පාලකයෙක් විය.

(iii) වැලිවිට ශ්‍රී සරණංකර සඟරජතුමා වර්තමාන **ධර්මශාස්ත්‍රෝන්නතියේ** පුරෝගාමියෙකි.

(ලකුණු 03 යි)

(ආ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් සුදුසු තනි පද** ලියන්න.

(i) දීර්ඝ කාලයකට අයත්

(ii) පුරාවස්තු එක්රැස් කොට තබා ඇති ස්ථානය

(iii) වරදට පෙළඹුණු පුද්ගලයකු නැවත නගා සිටුවීම

(ලකුණු 03 යි)

(ඉ) පහත දී ඇති වාක්‍යවල **හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා** ලියන්න.

(i) ප්‍රාචීන භාෂාවලින් ලබන ලද ................................ සිංහල සාහිත්‍ය පෝෂණයට හේතු විය.

(ii) බලවත් රටවල් නිතරම යුද්ධ ................................ වල නිරතවනු දක්නට ලැබෙයි.

(iii) අමාත්‍ය ................................ වෙනසක් ළඟදීම සිදුවනු ඇත.

(iv) ගියවර රාජ්‍ය සාහිත්‍ය ................................ යාපනුවේ දී පැවැත්විණි.

(v) තැන තැන මලින් සැදී ගිය ලිය ................................ විය.

(vi) මෙවර වෙසක් ................................ රජයේ අනුග්‍රහයෙන් කොළඹ දී පැවැත්විණි.

(ලකුණු 03 යි)

**(අභ්‍යාස / මණ්ඩල / ආභාසය / මඬුලු / උළෙල / උත්සවය)**

(ඊ) **තද කළු අකුරෙන්** දක්වා ඇති **බහු අර්ථ පදය යොදා වෙනත් අරුතක් දෙන ලෙස** වාක්‍යය බැගින් තනන්න.

(i) තක්සලාවට ගොස් **සතර** ඉගෙන එමි.

(ii) රාත්‍රි කාලයේදී පොකුණෙන් **සඳ** රත්තැටියක් මෙන් දිස්විය.

(iii) භික්ෂු ජීවිතය **වත්** පිළිවෙත් නිසා බබළයි.

(iv) ජයවර්ධනපුර කෝට්ටේ බිම් විශාල ප්‍රමාණයක් **පස්** පුරවා ගොඩ කර ඇත.

(v) බුදු දහම **කම්** සැප ඉවතලයි.

(vi) නිදහස් දින **තුරු** ගොස දසත පැතිරිණි.

(ලකුණු 06 යි)

[ පස්වෙනි පිටුව බලන්න.

6. **තද කළු අකුරින්** දක්වා ඇති පද **කුමන ව්‍යාකරණ අංගයකට අයත් දැයි** දක්වන්න.

(i) **පුරාතන** සිංහල **සාහිත්‍යය හදාරමින්** එයින් ලබන ලද ගුරුහරුකම් නවකතා රචනයට ද මාර්ටින් වික්‍රමසිංහ ඉවහල් කර ගත්තේ ය.

(ii) **සාම්ප්‍රදායික** සිංහල නාට්‍යකලාව **උදෙසා ඉමහත්** මෙහෙවරක් මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගෙන් ඉටු විය.

(iii) ඒ **භාග්‍යවත්** බුදුන් වහන්සේ **විසින්** දහම් **දෙසා** අංගුලිමාල දමනය කරන ලදී.

(iv) මඟුල් ගෙදරට **පැමිණි** සියලු දෙනාට **බතබුලතින්** සහ කිරිපැණියෙන් සංග්‍රහ **කෙරිණි.**

(v) **සුදුමලින් සැරසූ** රෙදිවලින් සාදන ලද **චෛත්‍යයක්** මෙවර පළමු තැනට තේරිණ. *(ලකුණු 15 යි)*

7. (අ) පහත දක්වෙන යෙදුම්වලට **වඩාත් ගැළපෙන** ප්‍රස්තාව පිරුළ ලියන්න.

(i) අකැමැත්තෙන් යමක් කිරීම

(ii) හොඳ මිනිසුන් ලෙස සමාජයට පෙනී සිට වැරදි කිරීම

(iii) තමා වැරදි කරමින් අන් අයට උපදෙස් දීම

(iv) තමාගේ අදහස් ඉටුවන තුරු අනෙක් අය රැවටීම

(v) යම් දෙයක් ඉවත දැමීමට නොහැකිවීම

(vi) වාසි පැත්තට කවුරුත් කැමති වීම. *(ලකුණු 03 යි)*

(ආ) පහත දී ඇති **රූඪිවල අදහස පැහැදිලි වන සේ** වාක්‍යවල යොදන්න.

(i) සුදුලූනු පොඩි කිරීම

(ii) දෙහි කැපීම

(iii) අං හරස් කිරීම

(iv) කිඹුල් කඳුළු හෙළීම

(v) ඔළුව ඉදිමිලා

(vi) පාලු ගෙයි වළන් බිඳීම *(ලකුණු 03 යි)*

(ඉ) පහත දී ඇති **එක් එක් යුගල පද සෑදී ඇති රටාව** කුමක් දැයි දක්වන්න.

(i) ඇඳ පුටු

(ii) මැහුම් ගෙතුම්

(iii) සිරිත් විරිත්

(iv) දුගී දුප්පත්

(v) බලු කපුටු

(vi) සුබ අසුබ *(ලකුණු 03 යි)*

(ඊ) පහත දී ඇති **ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පද** ලියා දක්වන්න.

(i) සකලයා

(ii) පරක් කරනවා

(iii) පුස්සනවා

(iv) පහළහයි

(v) බලලුවාව

(vi) පිරිගෙඩිය *(ලකුණු 03 යි)*

agaram.lk

(උ) පහත දී ඇති **ප්‍රාස්තාවික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන අරුත්** ලියන්න.

(i) කොට්ටෝරුවා

(ii) කිරි කෝඩුකාරයා

(iii) මුත්තා

(iv) අමදිනවා

(v) අට හොඳයි

(vi) ගෙවදිනවා *(ලකුණු 03 යි)*

8. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පරමධම්මචේතියආයතනයෙහිව්‍යුහයතදියවිෂයමාලාවහානිර්දිෂ්ටග්‍රන්ථාදියපිළිබඳවතොරතුරුඅප්‍රකටයඑසේහෙයින්අපට එළඹියහැකිනිගමනයනම්පරමධම්මචේතියශාස්ත්‍රායතනයවූකලීසංවිහිතඅධ්‍යාපනආයතනයක්නොවතත්කාලීනසම්ප්‍රදායය පරිද්දෙන්වියත්භික්ෂුවකගේමූලිකත්වයෙන්නවකභික්ෂූන්ශාස්ත්‍රාගමයෙහිනිරතකරවීමේඅධ්‍යාශයෙන්පවත්වාගෙනයනුලැබූවක් පමණක්බවයිපන්සල්කේන්ද්‍රකොටගත්මෙබඳුආයතනයටත්විජිතසමාජබලවේගවලටප්‍රතික්‍රියාවශයෙන්ඇරඹිවිද්‍යෝදය විද්‍යාලංකාරද්වයයආරම්භකිරීමෙන්අනතුරුවපැවතිඅතරඒවායේතත්ත්වයපිළිබඳවවර්ෂ1888දීඅධ්‍යාපනඅධ්‍යක්ෂ ඩබ්ලිව්එච්ග්‍රීන්විසින්පවසාඇතිකරුණුකෙරෙහිමඳක්විමසිලිමත්වියයුතුයැයිහැඟේ

(i) ඉහත ඡේදයේ අරුත් පැහැදිලි වන සේ සම්මත ව්‍යවහාරය අනුව පද බෙද අවශ්‍ය විරාම ලක්ෂණ යොද නැවත ලියන්න.

(ii) මේ ඡේදයේ සඳහන් පරිදි **'ඉස්පිල්ල'** සහ **'යංශය'** සහිත පද **දෙකක්** ලියන්න.

(iii) ඡේදයේ සඳහන් **'රකාරාංශය'** සහ **'ඇලපිල්ල'** සහිත පද **දෙකක්** ලියන්න.

(iv) ඉහත ඡේදයේ **"ප්‍රතික්‍රියා"** යන පදයෙහි ඇතුළත් පිල්ලම් නම් කරන්න.

(v) ඡේදයේ ඇතුළත් **නො වන** කොම්බු දෙක සහිත පදයක් ලියන්න. *(ලකුණු 15 යි)*

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

83471



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

සිංහල I
சிங்களம் I
Sinhala I

71 S I

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

උපදෙස්:

- ❊ **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- ❊ පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදු ගන්න.

**1.** පහත දක්වෙන උද්ධෘත පාඨ කියවා, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) මෙසේ පැතු පැතීම් ඇති මහපිනැති තැනැත්තවුන් එන්නන් දුරදී ම දක 'මුන්ට මා විනා අනික් පිහිට වියහෙන කෙනෙක් නැත. පිහිටක් වුවමනා වේද'යි යම් ලෙසක ඉවත නොගොසින් වෙහෙරට ම එත්නම් එලෙසට කළ සේක. පර්ෂදත් උන් එන්නවුන් දක'තෙල වියරු හුණු තැනැත්තිය මෙයට වැද්ද නොදෙව' යි කිවුය. බුදුහුත් 'උන් නොනවතව' යි වදරාලා ළහට ආ කලට තොප ශෝක මහත්ව මෙලෙසක් වූ බව මුත් සිහිනුවණ නැති කෙනෙකුන් නොවත් සිහි ලබව'යි වදළසේක. උයිත් ඒ ඇසිල්ලෙහි බුදුන්ගේ ආනුභාවයෙන් සිහිනුවණ ලත්හ. හිණ පිළී නැති තියාව එවේලෙහි සලකා හිරිඔතප් එළවාගෙන එළිල්ලෙන් හුන්හ. එක් කෙනෙක් තමන් පෙරව සිටි උතුරු සළුව දමාලූය.

(i) "බුදුන්ගේ ආනුභාවයෙන්" මෙහි බුදුන්ගේ යන්නෙහි ව්‍යාකරණ ලක්ෂණ දක්වන්න.

(ii) ඇය වෙහෙරට ම පැමිණීමට හේතුව කුමක් ද?

(iii) ඇයට වෙහෙරට වැද්ද නොදෙන්නට පිරිස ගත් උත්සාහය වැළැක්වූයේ කවරෙක් ද? කුමන හේතුවක් නිසා ද?

(iv) **'හිරිඔතප්'**, **'එළිල්ලෙන්'** යන වචනවලට අර්ථ සපයන්න. *(ලකුණු 04 යි)*

(ආ) එම්බා මහණෙනි, එදවස් චන්ද්‍රාලෝකයෙන් පන්සලට ගියාවූ ඒ සම්බුලා නම් බිසව තමාගේ වල්ලභයා නොදක මහත් වූ සෝක දුකින් පෙළෙන්නී යම් සේ පක්ෂි ධේනුවක් තමාගේ පුතු කැදල්ලෙහි තබා ගෝචර ග්‍රහණයට ගොස් එන වේලෙහි තුඩින් ගොදුරු ගෙනවුත් කැදල්ලෙහි දරු බිලිඳුන් නොදක මහත් ශෝකයට පැමිණේද එපරිද්දෙන් මේ කුමාරිකා ද වල්ලභයා නොදක අඬ අඬා මුරගා ඇවිදිනී මෙසේ කීය. 'මේ ලෝකයෙහි සමිත පාපී ශ්‍රමණ කෙනෙක් වේවයි බාහිත පාපී බ්‍රාහ්මණ කෙනෙක් වේවයි ඇත්නම් ඔවුන්ට නමස්කාර කෙරෙමි. ඔවුන්ගේ සරණ යෙමි. මාගේ රාජ පුත්‍රයාණන් වහා මා ඇස දක්වයි.' මෙසේ කිය කියා අඬ අඬා පන්සල වට කොට ඇවිදිනුය. තවද මහත් සෝකයෙන් අඬ අඬා වැළප කියන්නී 'මේ වෙනෙහි වසන සිංහ ව්‍යාඝ්‍රාදී යම් චතුෂ්පාදජාති කෙනෙක් ඇත්තාහුද තෘණ ලතා ජාතියෙහි වසන දේවතා කෙනෙක් ඇත්තාහුද පර්වත ගුහා ආදියෙහි වසන අල්පේශාඛ්‍ය මහේශාඛ්‍යවූද්‍යයි සියලු තළාටු හුමාටු දේවතා කෙනෙක් ඇද්ද ඔහු මාගේ වල්ලභයාණන් වහා ඇස දක්වූවාහු වී නම් ඔවුන්ට නමස්කාර කෙරෙමි. ඔවුන් සරණ යෙමි.'

(i) ඇය තම වල්ලභයා නොදක සෝදුකින් වැළපෙන්නේ කවරාකාරයෙන් ද?

(ii) ඇය හඬන්නේ කවර පොරොන්දු දෙමින් ද?

(iii) ඇය පන්සලට ගියේ කවර වේලාවක ද?

(iv) **'අල්පේශාඛ්‍ය'**, **'මහේශාඛ්‍ය'** යන වචනවල තේරුම ලියන්න. *(ලකුණු 04 යි)*

(ඉ) තෙල! තෝ මපුතණුවන් කරා ගොස්, ස්වාමීනි නුඹ පියාණන් වහන්සේ නුඹ සිතට ප්‍රිය වූ රාජ කුමාරිකාවක් හෝ බ්‍රාහ්මණ කුමාරිකාවක් හෝ ගෙනවුත් පාදපරිවාරිකා කොට පාවා දී නුඹ වහන්සේ ඔටුනු පළඳවා රාජ්‍යය දෙනු කැමැති සේක. එසේ හෙයින් තෙල චණ්ඩාල කෙල්ල හැරපුව මැනවැයි රාජවංශයට කිලුටු නොකළ මැනවැයි කාරණා කියා මපුතණුවන්ගේ අභිප්‍රාය දන් මට වහා අවුත් කියව'යි උගන්වා යැවූහ. ඔහු ද එපරිද්දෙන් ම රාජ කුමාරයන්ට කිව. එබස් අසා ශාලි රාජ කුමාරයෝ 'කිමෙක්ද තෙල! යහපත්ව විලිකුන් දෙළුන් කනු කැමැති දෙළන ස්ත්‍රියක මනා ව විලිකුන් කොතෙක් මී අඹ කැවත් ඇගේ දෙළ සන්හිඳේ ද, නොසන්සිඳෙන්නේ ම ය. එපරිද්දෙන් ම මොවුන් හැර අනිත් මනුෂ්‍ය ස්ත්‍රියක් තබා දිව්‍ය ස්ත්‍රියක පාවා දුන ද මාගේ මනෝරථය පිරෙන්නේ නොවෙයි. එසේ හෙයින් හිරු රසින් ප්‍රබුද්ධ වන්නා වූ පියුම්වන චන්ද්‍රාලෝක දක කෙසේ නම් ප්‍රබෝධශ්‍රීයට පැමිණේ ද?'

(i) චණ්ඩාල කෙල්ල හැරපුව මැනවැයි උපදෙස් දෙන්නේ කවර හෙයින් ද?

(ii) කෙනකුගේ මනෝරථය පිරෙන්නේ කෙසේ ද?

(iii) පියුම්වනය ප්‍රබෝධශ්‍රීයට පැමිණෙන්නේ කවරක් නිසා ද?

(iv) **'පාදපරිචාරිකා කොට පාවා දී'** මෙහි අදහස පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි)*

[ දෙවැනි පිටුව බලන්න.

agaram.lk

(ඊ) බඳ දද ලැල් පැහැරද පැතිර දස අ තේ
නඳ සඳ කැල්මෙන් දිලි කෙලෙසකුළු යු තේ
කොඳ සඳ කල් සුණුවම් උදුල පල බි තේ
ඉඳ මඳ කල් වහසල්කැරලි මුදුන තේ

ගුවන් කුස පැතිරි රන්කැරලිමිණි ර සේ
පවන් වැද ලෙලෙන දදමිණිකිකිණි ගො සේ
ලෙවන් සතුටු කළ හිමගිරිකුලෙක ලෙ සේ
සවන් මැදුර බල දිලිහෙන උතුරු දෙ සේ

(i) තොටගමු වෙහෙරෙහි වාසල කවියා දකින්නේ කෙසේ ද?
(ii) බුදුගෙය දිලිසෙන්නේ කවර ආකාරයෙන් ද?
(iii) **'කොඳ සඳ කල් සුණුවම්'** යන්නෙන් අදහස් කළේ කුමක් ද?
(iv) "හිමගිරිකුලෙක ලෙසේ" යන්නෙහි කාව්‍ය ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.
(i) "සෙසු පවතින් මට ප්‍රයෝජන නැත"
(ii) "දේවයන් වහන්ස, නුඹ වහන්සේ දරා ඉවසා සිටියෙමි"
(iii) "ස්වාමීනි සී සී මට නින්ද නොකළ මැනව"
(iv) "එයාව හම්බ වෙන්නෙ නෑ කිව්ව නෙ තවත්"
(v) "ටික දවසකට ද පිටරට යන්නේ?"
(vi) "දේවිය නියම කරන හැටියක්" (ලකුණු 08 යි)

(ඌ) පහත දක්වෙන කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

අපේ රටේ දරුවන් සිවු දෙනකුට ස්වීඩනයේ මව්පිය ස්නේහය ලැබීමේ වාසනාව උදා වී තිබේ.

**පුවත්පත් වාර්තාවක්**

වැහැරී ගිය උකුළේ නැත
සුව යහනක් සැදුණේ
වියළී ගිය දෙතනේ නැත
කිරි බිඳුවක් එරුණේ
කප පවතින තුරු නොතිමෙන
සුසුමෙන් සමුගැනුණේ
හිරු ගිලිහෙන මොහොතක නුඹ
මග අයිනක රැඳුණේ

උපන් බිමට නුඹ වැඩිවා මිසක දුවේ
වැදූ මවට නුඹ වැඩියක් වී ද දුවේ
දුක උහුලා ඉන්නට මට හැකිය දුවේ
නැව් නැගිලා දුරු රටකට යන්න දුවේ

පෙර කළ මහ පින් මහිමෙනි
මේ දෙස උපදින්නේ
ඉපදෙනු මිස රැඳෙනා පින
ඇයි නුඹ සතු නොවුණේ
දරුවන් ඇස කඳුළින් ළය
උණු වන මිනිසුන්නේ
සරණින ලොව කොතැනක වුව
සැනහෙන් දියණියනේ

මතු යම් දිනෙක සිහිවිල්ලෙන් සිටින සඳ
දැනක පහස සිහිනෙක මෙන් දනේ විඳ
සිතියම් පොතින් ලොව විමසා බලන සඳ
කඳුලක හැඬය මහ සයුරේ දකී විඳ (ලකුණු 16 යි)

agaram.lk

[ තුන්වැනි පිටුව බලන්න.

2. "රස විඳීමට කථාවක් සහ ආගමික වශයෙන් උපදේශයක් ඉදිරිපත් කිරීම සද්ධර්මරත්නාවලී කතුවරයාගේ අභිප්‍රාය වූයේ ය." නිර්දිෂ්ට කථා ඇසුරෙන් විමසන්න. (ලකුණු 15 යි)

**නැතහොත්**

"ජාතක කථා පොතෙහි අන්තර්ගත ව ඇත්තේ, සමාජයේ ජීවත්වන මිනිසුන්ට මෙලොව වශයෙන් ජීවිතය සාර්ථක කර ගැනීමටත් පරලොව වශයෙන් සුගතියක් ලැබීමටත් අවශ්‍ය හොඳ - නරක කියා දීම ය." නියමිත කථා **දෙකක්** ඇසුරෙන් උක්ත කියමන විමසන්න. (ලකුණු 15 යි)

3. "සම්භාව්‍ය සිංහල ගද්‍ය සාහිත්‍යයෙහි දක්නට ලැබෙන ප්‍රධාන පරමාර්ථයක් වන්නේ සදාචාර ගුණ සම්පන්න සමාජයක් බිහිකිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීම ය." සද්ධර්මාලංකාරයේ නියමිත කථා ඇසුරු කොට මෙම කියමන පිරික්සන්න. (ලකුණු 15 යි)

4. "ගිරා සන්දේශය චිත්තාකර්ෂණීය කාව්‍ය රචනයක් මෙන් ම කාලීන සමාජය පිළිබඳ තොරතුරු හෙළි කරන කෘතියක් වශයෙන් ද වැදගත් වෙයි." වර්ණනා **දෙකක්වත්** ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි)

5. "මළගිය ඇත්තෝ උසස් නව කතාවක් වන්නේ අත්දැකීම් ප්‍රකාශනයට උචිත ගීතාත්මක ගද්‍ය භාෂාවක් භාවිත කොට ඇති නිසා ය." මෙම කියමන සැබෑදැයි පිරික්සන්න. (ලකුණු 15 යි)

6. "කෙටිකතාකරුවාගේ කාර්යය වන්නේ කිසියම් සිද්ධියක්, අවස්ථාවක්, චරිතාංගයක් පාඨකයා තුළ අනුභූතියක් ජනිතවන ආකාරයට ඉදිරිපත් කිරීම ය." නියමිත කෙටිකතා **තුනක්** ඇසුරෙන් මෙම කියමන සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි)

7. "නූතන කවීන් සෞන්දර්ය වර්ණනාවලට වඩා වැඩි අභිරුචියක් දක්වන්නේ පෞද්ගලික අත්දැකීම් ප්‍රකාශනය සඳහා ය." නිදසුන් ඇසුරෙන් මෙම කියමන විමසන්න. (ලකුණු 15 යි)

8. "තම රුචි අරුචිකම් අනුව කටයුතු කරන්නට ඉඩක් නොලබන වාසවදත්තා බිසව අවස්ථානුකූලව හැසිරෙන්නේ සිය පැවැත්ම සඳහා ය." මෙම අදහසෙහි සත්‍යාසත්‍ය භාවය සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි)

***

agaram.lk

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

සිංහල II
சிங்களம் II
Sinhala II

71 S II

## II කොටස

2. (අ) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සිංහල සංස්කෘතිය භාරතීය සංස්කෘතිය පදනම් කොට ඇතත්, ස්ථවිරවාද බුද්ධාගම නිසා එය භාරතීය හින්දු සංස්කෘතියෙන් වෙන් වූවක් බවට පත් විය. සිංහල සංස්කෘතියට බුද්ධාගමේ ඇති සම්බන්ධයත් භාරතීය සංස්කෘතියට හින්දු සමයයෙහි ඇති සම්බන්ධයත් එක හා සමාන නොවේ. අතීතයේ පටන් ම බුද්ධ ධර්මය සාමූහික ලෙස කරන ආගමික වැඳුම් පිදුම්වලින් තොර වතාවත් අඩු ධර්මයක් විය. අදත් ඒ එසේම ය. මේ හැරුණු විට යාඥාවට හෝ උත්තර මානුෂීය බල ඇති අයට කරන ආයාචනයට හෝ තැනක් බුද්ධාගමේ නැත. එහෙත් ඒ වෙනුවට පෞද්ගලිකව කැරෙන ආත්ම දමනයෙන් **ආධ්‍යාත්මික පාරිශුද්ධිය** ලැබීමත් සංස්කාරයන්ගේ අනිත්‍යය මෙනෙහි කිරීමෙන් **නෛෂ්ක්‍රම්‍යය** පුහුණු කිරීමත් උගන්වනු ලැබේ. මේ අනුව ජීවිතය ගැන බුද්ධ ධර්මය දරන දෘෂ්ටිය පෞද්ගලිකත්වය වටා ගෙතුණු අතරම වඩා ප්‍රඥාගෝචර ද වෙයි. වෙනස් කළ නොහැකි ලෙස ක්‍රියාත්මක වන කර්මඵල නියමයක් ගැන එහි අවධාරණයෙන් කියවේ. මේ කර්මඵල නියමය කෙරෙහි එක ම ස්වාමියා මිනිසා ය. ලෝකෝත්තර බලවේගයන්ගෙන් කිසි පිහිටක් නොලැබේ. දේව භක්තිය මත පදනම් වූ ආගමකට වඩා බුද්ධ ධර්මය වෙනස් ය. දේව භක්තිය මත ගොඩනැංවුණු ආගමක දී දෙවියන් හා මිනිසුන් අතර පැවැත්වෙන සම්බන්ධකම් විවිධ ක්‍රම ගන්නා අතර, ඒවා එම ජන සමාජයෙහි සංස්කෘතියේ ම අංග බවට පත් වේ. මේ නිසා බුද්ධ ධර්මය, ඉහත කී විධියේ ලෞකික සංස්කෘතියකට අවශ්‍ය සම්පූර්ණ අංගෝපාංග, එය අනුගමනය කරන සමාජයට නොදෙයි. ගම්බද සිංහල ජනයාගේ අවශ්‍යතාවනට සරිලන ලෙස සකස් වීම සඳහා, බුද්ධ ධර්මයට ජන ඇදහීම් හා හින්දු විශ්වාසයන් සමඟ සංකලනය වීමට සිදු විය.

(i) භාරතීය හින්දු සංස්කෘතියෙන් සිංහල සංස්කෘතිය වෙනස් වූයේ කුමක් නිසා ද?

(ii) මේ ඡේදයේ සඳහන් වන පරිදි බුද්ධ ධර්මයේ විශේෂ ලක්ෂණ **දෙකක්** පහදා දෙන්න.

(iii) මේ ඡේදයෙහි දක්වෙන පරිදි බුදු සමයයෙහි ඇති ඉගැන්වීම් පහදා දෙන්න.

(iv) ගම්බද ජනයා ඔවුන්ගේ අවශ්‍යතාවලට සරිලන පරිදි බුදු දහම සකස් කර ගත්තේ කෙසේ ද?

(v) **ආධ්‍යාත්මික පාරිශුද්ධිය, නෛෂ්ක්‍රම්‍යය** යන වචනවල අරුත් පැහැදිලි කරන්න.

*(ලකුණු 10 යි)*

(ආ) පහත දක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග, වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

පාඨක ජනයාත් විචාරකයාත් එක් අවස්ථාවක ඉතා ඉහළින් අගේ කළ කෘතිය තව වරෙක නොතකා හැරීමේ අවස්ථා සාහිත්‍ය ලෝකයේ හිඟ නොවේ. එක් අවධියක එක් සාහිත්‍යාංගයක් ජනප්‍රිය වන අතර තවත් අවස්ථාවක අනෙක් සාහිත්‍යාංගයක් ජනප්‍රිය වනු ඇත. මෙවැනි ධර්මතා සහ ඒවාට පසුබිම් වූ හේතුසාධකාදිය විභාග කිරීමත් මෙම අධ්‍යයනයට අයත් වෙයි. ඇතැම් ලේඛකයන්ගේ කෘති සාධු සම්මත වූයේත් ශ්‍රේෂ්ඨ නිර්මාණ ලෙස පිළිගැනුණේත් ඒ කර්තෘන් මිය පරලොව ගියාට ද පසුව බව අපි දනිමු. අනෙක් අතින් ඇතැම් කෘති එහි කර්තෘවරයා ජීවත්ව සිටිය දී හෝ ඔහුත් සමඟ ම අභාවයට යනු පෙනේ. තවත් කෘතියක් එදත් අදත් හෙටත් ප්‍රශංසාවට ම පාත්‍ර වන්නේ ය. ඇතැම් කෘතියක් ශ්‍රේෂ්ඨ නිර්මාණයක් සේ මුලින් පිළිගැනෙනුයේ එම කෘතිය බිහි වූ දේශය තුළ නොව, අනෙක් රටක විය හැකි ය. මේ සියල්ල සිදුවන්නේ හේතු රහිතව නොවේ. මෙවැනි කරුණු විභාග කිරීමත් සමාජීය සාහිත්‍ය අධ්‍යයනයට පැවරෙන වගකීමක් වෙයි.

ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත් විජිතයක්ව සිටීමේ දායාදයක් වශයෙන් ඉංග්‍රීසි සාහිත්‍ය කෘති මෙරට පාඨකයා අතර පැතිරුණ අතර එක් අවධියක ප්‍රංශ හා රුසියානු සාහිත්‍යයන් ජනප්‍රිය වීමට හේතු තිබිය යුතු ය. පිහිටීම අතින්නුත් ඓතිහාසික හා සංස්කෘතික සම්බන්ධතා අතින්නුත් අපට වඩාත් සමීප රට වන ඉන්දියාවේ චිරන්තන සාහිත්‍යයත් සාහිත්‍ය විචාර වාදත් මෙහි නොඅඩුව ප්‍රචලිත වූ නමුත් වර්තමාන සාහිත්‍යය සම්බන්ධයෙන් එසේ නොවීමට හේතු කවරේ ද? සිංහල පාඨකයා අන් හැම සාහිත්‍යයකට ම වඩා අඩුවෙන් දන්නේ අපේ ම සහෝදර ජනතාව වන දෙමළ ජනයාගේ සාහිත්‍යය නොවේ ද?

*(ලකුණු 15 යි)*

[ හතරවෙනි පිටුව බලන්න.